**ශීර්ෂය 320 - සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

ශීර්ෂය 320 - සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජුනි 30 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 17,477.92 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 17,301.40 ක් උපයෝජනය කර තිබුණි. දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 176.52 ක් හෙවත් සියයට 1.01 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 17,289.92 | 17,114.02 | 175.90 | 1.02 |
| මූලධන | 188.00 | 187.38 | 0.62 | 0.33 |
| එකතුව | 17,477.92 | 17,301.40 | 176.52 | 1.01 |

(ආ) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා දෙපාර්තමේන්තුව වෙත වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන 2.9 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1.6 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 1.3 ක් හෙවත් සියයට 44.83 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 32001 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 340.00 | 327.55 | 310.00 | 321.05 | 48.00 | 14.89 |

## 2.3 අග්‍රිම ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7002/0000/00/0396/00/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය රු.මිලියන 1.67 ක් විය.

## 2.4 විගණන නිරීක්ෂණ

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

# 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව, ඇප ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.

## 3.2 විසර්ජන ගිණුම

### 3.2.1 වෙනත් දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන

වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ලබා දුන් ප්‍රතිපාදන සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අන්නාසිගල අයිස්පිල්ල විදුලි වැට කි.මී 35 ක් ඉදිකිරීම සඳහා 2013 මාර්තු 04 දින වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් රු.4,709,268 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. එහෙත් 2015 වර්ෂය අවසන් වන විටත් කි.මී 13 ක වැඩ අවසන් කර නොතිබුණි.

(ආ) 2013 වර්ෂයේ දී විදුලි වැට ඉදිකිරීම වෙනුවෙන් කළාප භාර නිලධාරීන් පස් දෙනෙකු වෙත ලබා දී තිබුණු රු.1,065,400 ක අත්තිකාරම් අදාල කාර්යය ඉටු නොකර මුදලින් ආපසු පියවා තිබුණි.

(ඇ) 2013 වර්ෂයේ දී විදුලි වැට ඉදිකිරීම වෙනුවෙන් ලබාදුන් අත්තිකාරම්වලින් රු.3,058,360 ක් 2015 මාර්තු මාසය වනවිට ද පියවා නොතිබුණි.

## 3.3 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### වාර්ෂික කාර්යසාධන වාර්තාව

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව 2016 මැයි 27 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 3.4 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

### (අ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම

ජනාධිපති ලේකම් කාර්යාලය විසින් විධිමත් අනුමැතියකින් තොරව වාහන 16 ක් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට 2006 වර්ෂයේ දී ලබාදී තිබුණු අතර එම වාහන මෙතෙක් පවරා ගෙන නොතිබුණි.

### (ආ) බේරුම් නොකළ බැරකම්

දෙපාර්තමේන්තුව විසින් 2015 දෙසැම්බර් 31 දිනට රු.27,594,941 ක්වූ බැරකම් වලට එළඹ තිබුණි.

## 3.5 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 371(ඇ) | 1,960,582 | අවස්ථා 08 කදී ලබා දී තිබුණු තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වූ වහාම පියවා නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 381(1) | - | බැංකු ජංගම ගිණුම් 47 ක් හා ඉතිරිකිරීමේ ගිණුම් 23 ක් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව ආරම්භ කර තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 395(ආ) හා (ඇ) | | දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘතිවලට අයත් බැංකු ජංගම ගිණුම් 19 ක් වෙනුවෙන් බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි. |
| (ආ) **රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | | |
| 2015 ජූලි 14 දිනැති අංක PFD/RED/01/04/2015 දරන චක්‍රලේඛයේ ‘‘ආ’’ ඡේදය | 33,312,935 | අවස්ථා 33 කදී රු.100,000 ක සීමාව ඉක්මවා තත්කාර්ය අතුරු අග්‍රිම රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව නිකුත් කර තිබුණි. |

## 3.6 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-----------------------------------

දෙපාර්තමේන්තුව විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) 2014 ජුනි 22 දින දෙපාර්තමේන්තු ධජ 200 ක් මිල දී ගෙන තිබියදී, 2014 නොවැම්බර් 22 දින මිහින්තලේ පැවැත්වූ උත්සවය වෙනුවෙන් තවත් ධජ 200 ක් රු.990,000 කට මිලදී ගෙන තිබුණි. එහෙත් එම ධජ අදාළ උත්සවය පැවැත්වීමෙන් පසු 2014 දෙසැම්බර් 22 දින සැපයුම්කරු විසින් දෙපාර්තමේන්තුව වෙත සපයා තිබුණි.

(ආ) ව්‍යාපෘතිවලට අනුයුක්ත කර ඇති උපරිම භට සංඛ්‍යාව 24,000 ක් වුවත්, දෙපාර්තමේන්තුවේ විවිධ ව්‍යාපෘති ආදායමින් රු.66,600,000 ක් වියදම් කර ගමන් මළු 36,000 ක් මිලදී ගෙන තිබුණි. ඒ අනුව ගමන් මළු 12,000 ක් වැඩිපුර මිලදී ගෙන තිබුණි. එම මිලදී ගැනීම සඳහා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබාගත යුතු වුවත්, මුළු ඇණවුම කොටස් හතරකට වෙන්කර දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියෙන් මිලදී ගෙන තිබුණි. ඉහත සඳහන් පරිදි මිලදී ගත් ගමන් මළු සියල්ල 2013 සැප්තැම්බර් 30 දින වනවිට ගබඩාවට භාරදිය යුතු වුවත්, එකතුව රු.2,035,000 ක් වටිනා ගමන් මළු 1,100 ක් 2015 දෙසැම්බර් මාසය වන විටත් සැපයුම්කරු විසින් ගබඩාව වෙත සපයා නොතිබුණි.

(ඇ) අවස්ථා 08 කදී ලබා දී තිබුණු එකතුව රු.1,590,510 ක තත්කාර්ය අතුරු අග්‍රිම අදාළ කාර්යය සඳහා යෙදවීමකින් තොරව දිර්ඝ කාලයක් අත රඳවා ගැනීමෙන් පසුව ආපසු පියවා තිබුණි.

## 3.7 අවිධිමත් ගනුදෙනු

----------------------

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

-----------------------------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව රු.500,000 ක් ඉක්මවන භාණ්ඩ හෝ සේවා මිලදී ගැනීමකදී සැපයුම්කරු සමඟ ලිඛිත ගිවිසුමකට එළඹිය යුතු වුවත්, පහත සඳහන් ප්‍රසම්පාදන කාර්යයන් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.

(i) උත්සව නිල ඇඳුම් 50 ක් හා කාර්යාල නිල ඇඳුම් 300 ක් රු.1,653,624 ක් වැය කර මසා සපයා ගැනීම.

(ii) මුලස්ථාන ගොඩනැගිල්ලේ පිවිසුම් දොරටුවේ සිට පියගැට පෙළ දක්වා සිවිලිම හා දෙපස බිත්ති අධිපැනල්වලින් රු.1,273,480 ක් වැය කර ආවරණය කිරීම හා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 මාර්ගෝපදේශය ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබීම.

(iii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.6 (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව, කොන්ත්‍රාත්කරුවකුට ගෙවිය යුතු සෑම ගෙවීමකදීම නිශ්චිත මුදලක් රඳවා ගත යුතු වුවත්, ඉහත කොන්ත්‍රාත්කරුට ගෙවන ලද රු.774,200 ක මුදලින් කොටසක් රඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iv) දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල කුලියට ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

- රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව ලංසු කැඳවා නොතිබුණි.
- මුදල් රෙගුලාසි 835(අ) ප්‍රකාරව, දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලය සඳහා සුදුසු රජයේ ගොඩනැඟිලි කිසිවක් නොමැති බව තහවුරු කරවා ගෙන නොතිබුණි.
- මුදල් රෙගුලාසි 835(ඉ) ප්‍රකාරව, බදු ගිවිසුම් කාලසීමාව අවුරුදු 03 කට නොවැඩි විය යුතු වුවත්, උක්ත ගොඩනැගිල්ල සඳහා අවුරුදු 05 ක කාලයකට බදු ගිවිසුම් අත්සන් කර තිබුණි.
- උක්ත ගොඩනැගිල්ලේ බදු කාල සීමාව 2012 සැප්තැම්බර් 30 දින අවසන් වුවත්, නව බදු ගිවිසුමකින්ද තොරව තවදුරටත් දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලය පවත්වා ගෙන යන අතර 2015 සැප්තැම්බර් දක්වා රු.89,447,501 ක් කුලී වශයෙන් ගෙවා තිබුණු අතර වරිපනම් ගාස්තු ලෙස රු.2,514,358 ක් ගෙවා තිබුණි.
- උක්ත ගොඩනැගිල්ලේ අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් 2015 ජනවාරි 23 දින රු.1,461,358 ක් ගෙවා තිබුණි.

**3.8 පාඩු හා හානි**

----------------

2014 වර්ෂයේ සිට පැවත එන රිය අනතුරු නිසා සිදු වූ හානි වටිනාකම රු.179,820 ක් වී තිබුණත්, 2015 දෙසැම්බර් 31 දින වන විටත් එම හානි අයකර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කර නොතිබුණි.

**3.9 අනාර්ථික ගනුදෙනු**

-----------------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ**.**

(අ) පෙර පාසල් ගුරුවරියන් සඳහා සාරි මිලදී ගැනීමේ දී රු.14,500,000 ක් වටිනා සාරි 10,000 ක් අවශ්‍යා ප්‍රමාණයට වඩා වැඩියෙන් මිලදී ගෙන තිබූ අතර 2015 ඔක්තෝබර් 09 දිනය වනවිට ද සාරි 3,783 ක් ගබඩාවේ තිබුණි.

(ආ) වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම අනුව වර්ෂයේ සපත්තු පොලිෂ් අවශ්‍යතාවය පොලිෂ් ටින් 70,000 ක් වුවද, පොලිෂ් ටින් 80,000 ක් මිලදී ගැනීමට කටයුතු කර තිබුණි.

(ඇ) ඉහත පරිදි මිලදී ගත් පොලිෂ් ටින් 80,000 ක් එකක් රු.98.80 ක් ( එකතු කළ අගය මත බදු රහිත) බැගින් මිල දී ගෙන තිබුණද, නිෂ්පාදකයා විමසා මිලදී ගැනීමට කටයුතු කළේ නම් එකක් රු.72 කට ( එකතු කළ අගය මත බදු සහිත) මිලදී ගැනීමට හැකිව තිබුණි. ඒ අනුව අදාළ මිලදී ගැනීම සඳහා රු.3,013,440ක් වැඩිපුර වැයකර තිබූ බව නිරීක්ෂණය විය.

## 3.10 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 15 | 14 | 01 | - |
| (ii) | තෘතියික මට්ටම | 15 | 10 | 05 | - |
| (iii) | ද්විතියික මට්ටම | 21 | 16 | 05 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 40,060 | 38,758 | 1,302 | - |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 33 | - | 33 |
| | එකතුව | 40,111 | 38,831 | 1,313 | 33 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 1,313 ක් පැවැතී තිබුණත්, 2015 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු විසර්ජන ගිණුම අනුව සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරි වී තිබුණත්, එම ඉතිරියන් කෙරෙහි කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවැතිම බලපා නොතිබුණි. ඒ අනුව අනුමත කාර්ය මණ්ඩලය අධි ඇස්තමේන්තු කිරීමක් විගණනයේදී නිරීක්ෂණය විය.

(ii) බඳවා ගෙන තිබුණු අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳව විධිමත් අනුමැතියක් ලබාගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.